# 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සේවායෝජකයින් ලියාපදිංචි කිරීම

**සේවායෝජකයින් සඳහා උපදෙස් :**

01. (I) සේවායා විසින් සම්පූර්ණ කරන ලද 'D' ආකෘති පත්‍රවල මුල් පිටපත් 02කින්/ ලියාපදිංචි කිරීම විමධ්‍යගත කර ඇති කාර්යාල සඳහා භාරදෙන්නේ නම් පිටපත් 03කින් ඉදිරිපත් කළ යුතු ය.
    (II) ආයතනයේ සේවකයින්ගේ විස්තර සඳහන් කළ 'D' ඇමුණුම් ආකෘති පත්‍ර මුල් පිටපත් 02ක් ද(සේවකයින් 10ට වැඩි නම් 'D' ඇමුණුමෙහි ආකෘතියට සමාන සේවක විස්තර සටහන් කළ මුද්‍රිත ආකෘති පත්‍ර 02ක්) ආයතනයේ අයිතිකරු/හවුල්කරු/අධ්‍යක්ෂ විසින් නිල මුද්‍රාව ද සහිත ව සහතික කොට ඉදිරිපත් කළ යුතු ය.
02. ආයතනය/ව්‍යාපාරය ආරම්භ කළ දිනය හෝ ලියාපදිංචි කළ දිනය සහ සේ.අ.අ.හි ලියාපදිංචි වන දිනය අතර වසර දෙකකට වැඩි කාල පරතරයක් ඇත්නම් සේවායෝජකයා විසින් ඊට හේතු ලිඛිත ප්‍රකාශයකින් ඉදිරිපත් කළයුතු ය.
03. ඉහත ලියවිලි සඳහා අත්සන් කළ යුත්තේ ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු,හවුල්කරුවකු හෝ ආයතනයේ අයිතිකරු (එනම් 'D' ආකෘති පත්‍රයේ 6වන තීරුවේ නම් සඳහන් අයෙකු) පමණි. එසේ නොවන අවස්ථාවක දී එම අත්සන් කරනු ලබන පුද්ගලයා වෙනුවෙන් ඇටර්නි බලතල ලබා දී තිබීම අනිවාර්ය වන අතර එහි පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

මෙම ආකෘති පත්‍රවලට අමතරව, ලියාපදිංචි කරනු ලබන ආයතනය/ව්‍යාපාරය,

❖ **තනි පුද්ගල ව්‍යාපාරයක් නම්,**

I. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක්,
II. ආයතනයේ/ව්‍යාපාරයේ අයිතිකරුගේ ජා.හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

සමඟ ඉදිරිපත් කළ යුතු ය.

❖ **හවුල් ව්‍යාපාරයක් නම්,**

I. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක්,
II. ආයතනයේ/ව්‍යාපාරයේ සියළුම හවුල්කරුවන්ගේ ජා.හැඳුනුම්පත්වල ඡායා පිටපත්,

සමඟ ඉදිරිපත් කළ යුතු ය.

❖ **සීමිත/ සීමාසහිත පුද්ගලික/ වගකීමෙන් සීමිත හෝ ඇපයෙන් සීමිත සමාගමක් නම්,**

I. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ/සංස්ථාගත කිරීමේ සහතිකයේ ඡායා පිටපතක්,
ර සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කළ, ආයතනයේ/ව්‍යාපාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු සඳහන් ආකෘති පත්‍ර 01/05 (FORM 01/05) හෝ ආකෘති පත්‍ර 20/40(FORM 20/40)හි සත්‍ය පිටපතෙහි ඡායා පිටපතක්,

සමඟ ඉදිරිපත් කළ යුතු ය.

❖ **විදේශ සමාගමක් නම්,**

I. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ/සංස්ථාගත කිරීමේ සහතිකයේ සත්‍ය ඡායා පිටපතක්,
II. සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කළ ආකෘති පත්‍ර 44,45,46(FORM 44,45,46)හි සත්‍ය පිටපත්වල ඡායා පිටපත්,
III. 'D' ආකෘති පත්‍රවල අත්සන් කරනු ලබන්නේ ඉහත ආකෘති පත්‍ර 45(FORM 45)හි සඳහන් අධ්‍යක්ෂවරයෙකු නොවන පුද්ගලයෙකු නම් ඒ සඳහා ඇටර්නි බලතල(POWER OF ATTORNEY) ලබා දී ඇති ලියවිල්ලේ පිටපතක්,
IV. ඉහත (III)හි සඳහන් පුද්ගලයාගේ ජා.හැඳුනුම්පතෙහි හෝ විදේශ ගමන් බලපත්‍රයෙහි සත්‍ය ඡායා පිටපතක්,

සමඟ ඉදිරිපත් කළ යුතු ය.

❖ **රාජ්‍ය ආයතන හා සම්බන්ධ සංවිධාන, අධිකාරී, ව්‍යාපෘති ලියාපදිංචි කිරීමේ දී**

I. ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති ලේඛනයේ පිටපතක් හා ආයතනයේ කර්තව්‍යයන් බලාත්මක කිරීම සඳහා යම් පනතක් අදාළ වේ නම් එහි පිටපතක්,
II. අදාල කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියක්,
III. (ව්‍යාපෘති) අධ්‍යක්ෂ, සභාපති සඳහා ලබා දී ඇති පත්වීම් ලිපියේ පිටපතක්,
IV. භාණ්ඩාගාර අනුමැතිය දෙන ලද ලිපියේ පිටපතක්,
V. එක් සේවකයෙකුට හෝ ලබා දී ඇති පත්වීම් ලිපියක පිටපතක්,
VI. (ව්‍යාපෘති) අධ්‍යක්ෂ, සභාපති විසින් පහත ලිපිනයට ඉදිරිපත් කරන සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වීමට ලිඛිත ව කරන ඉල්ලීමක්, සමඟ ඉදිරිපත් කළ යුතු ය.

***සේ.අ.අ.හි ලියාපදිංචිය සඳහා උක්ත ලියවිලි අනිවාර්යයෙන් ඔබ විසින් සැපයිය යුතු අතර එසේ නොවන්නේ නම් ඔබ ආයතනය ලියාපදිංචි වීම ප්‍රතික්ෂේප විය හැකි බව කරුණාවෙන් සලකන්න.***

---

සහකාර කම්කරු කොමසාරිස්, සේවක අර්ථසාධක අරමුදල, කම්කරු දෙපාර්තමේන්තුව, නාරාහේන්පිට,කොළඹ 05.
විමසීම් : +94112369376 (සේ.අ.අ. ආයතන ලියාපදිංචි) / +94112368062 (නියෝජ්‍ය කම්කරු කොමසාරිස්-සේ.අ.අ.)